# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2044/28 – 2017 නොවැම්බර් මස 08 වැනි බදාදා - 2017.11.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV(අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ පළාත් සභාවේ 2017 අංක 4 දරන පුස්තකාල සේවා මණ්ඩල (සංශෝධන) ප්‍රඥප්තිය අනුමත කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් 2017 වර්ෂයේ ඔක්තෝබර් මස 12 වැනි දින සම්මත කරන ලදුව 2017 වර්ෂයේ ඔක්තෝබර් 16 වැනි දින ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙහි පළ කරමි.

ආර්. ඒ. එච්. ඒ. සමරසිංහ,
ලේකම්,
ඌව පළාතේ පළාත් සභාව.

2017, නොවැම්බර් මස 02 වැනි දින,
බදුල්ල, රජ වීදියේ පිහිටි,
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.


1A – PG 3745 – 17 (2017/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඌව පළාතේ පළාත් සභාවේ 2017 අංක 04 දරන පුස්තකාල සේවා මණ්ඩල (සංශෝධන) ප්‍රඥප්තිය**

ඌව පළාතේ පළාත් සභාවේ 2000 අංක 05 දරන පුස්තකාල සේවා මණ්ඩල ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා පනවනු ලබන ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ පළාත් සභාවේ 2017 අංක 04 දරන පුස්තකාල සේවා මණ්ඩල (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, අන්‍යාකාරයකින් සඳහන් කර ඇත්නම් මිස එය ඌව පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන ලද දින සිට බලාත්මක වන්නේය.

3 (ඒ) අලුත් උප වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

2. මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් හඳුන්වනු ලබන ඌව පළාත් සභාවේ 2000 අංක 5 දරන පුස්තකාල සේවා මණ්ඩල ප්‍රඥප්තියේ 3 (එ) උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 3 (ඒ) උපවගන්තිය ලෙස බලපැවැත්විය යුතුය.

3 (ඒ) පුස්තකාල සේවා ව්‍යාප්තියට අවශ්‍ය වන්නා වූ සාමූහික සැලසුම්කරණය, මධ්‍යගත හා ඒකාබද්ධ සූචි සම්පාදනය, පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය, ප්‍රාදේශීය එකතුන් වර්ධනය කරලීම සහ ප්‍රතිග්‍රහණ කටයුතු, අන්තර් පුස්තකාල හුවමාරු සේවා හා පිරුළු සේවා, ජංගම පුස්තකාල සේවාවන් පිහිටුවීම, විඥාපන ජාල පිහිටුවීම, ආදී කටයුතු තුළින් පුස්තකාල සංවර්ධනය උදෙසා කටයුතු කිරීම හා පළාතේ පුස්තකාල සේවාවේ ඒකීයත්වයක් ගොඩනැගීම.

6 (අ) (I) (ඒ) අලුත් උපවගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (අ) (i) (එ) උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 6 (අ) (i) (ඒ) උප වගන්තිය ලෙස බල පැවැත්විය යුතු ය.

(අ) (I) (ඒ) පළාත් සංස්කෘතික අමාත්‍යංශයේ ලේකම්

6 (අ) (I) හා (II) (ඒ) අලුත් උපවගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 6 වන වගන්තියේ (අ) (I) (ඒ) වන උප වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම උප වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 6. (ආ) I හා II උපවගන්ති ලෙස බලපැවැත්විය යුතු ය.

මණ්ඩලයේ සභාපතිවරයාගේ කාර්යභාරය.

6. (ආ) (I) අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන මණ්ඩලයේ සභාපතිවරයා මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී මුලසුන දැරිය යුත්තේ ය. ඔහු/ඇය මණ්ඩලයේ ප්‍රධාන විධායක නිළධාරියා විය යුතු ය. රජයේ හා පළාත් සභාවේ ප්‍රතිපත්තීන්ට අනුකූලව පුස්තකාල සේවා මණ්ඩලය මෙහෙයවීමේ වගකීම සභාපතිවරයා සතුවන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම්වල ගණපූරණය.

II. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක ගණපූරණය සාමාජිකයින් පස් දෙනෙකු විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

5. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

11- 1043

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.